D

# නිවේදනය

ගරු මන්ත්‍රීවරුනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සම්බන්ධයෙන් කරුණු කිහිපයක් පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් සියලුදෙනාගේ කාරුණික අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව අවම වශයෙන් තුන්වැනි අවස්ථාවේදීවත් පිළිතුරු සැපයිය යුතු බැවින් පිළිතුරු ලබාදීම සඳහා එම ප්‍රශ්න යොමුවන විෂයභාර අමාත්‍යවරයන් නියමිත දිනයේදී පාර්ලිමේන්තුවට පැමිණ එම ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදීමටත්, අමාත්‍යවරයා නොසිටින අවස්ථාවක කැබිනට් නොවන අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් අදාළ ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීමටත්

කටයුතු කරන ලෙස කාරුණිකව මෙයින් දන්වා සිටිමි.

ප්‍රශ්න පිළිබඳව කලින් දැනුම්දීම, පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය මඟින් සිදුකරනු ලබන බැවින් අදාළ මන්ත්‍රීවරයන් නියමිත දිනයේදී පාර්ලිමේන්තුවේ ප්‍රශ්න සඳහා නියමිත වේලාවේදී  එම ප්‍රශ්න ඇසීමට කටයුතු කරන ලෙසත් සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත දැනුම්දීමට කැමැත්තෙමි.